# Eco Buddy ජීව වායු ජනකයේ මූලික නඩත්තුව සඳහා උපදෙස්

**01 පළමු සතිය**

ජීව වායු ජනකය තුල නිපදවෙන වායුව ජලය ඉවත් කිරීමට ඇති වැල්වය විවර කර දිනපතා ඉවත් කරන්න.

ජීව වායු ජනකය සවිකොට දින 4කට පසුව එහිඇති ජීව වායුව දැල්ල පත්තුවනවාද ඔබට නිරීක්ෂණය කලහැක. ඒසදහා රාත්‍රීකාලයේදී කබදායියක් දල්වා ජලය ඉවත්කරන වැල්වය සෙමින් විවෘතකර එයට කිට්ටුකරන්න. එවිට දැල්ල නිල්පාටින් දැල්වේ නම් එහි බැක්ටීරියාව වර්ධනය ආරම්භවී ඇත. නිපදවෙන එම වායු ප්‍රමාණය දිනපතා සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න. හැකි නම් ලිප සඳහා භාවිතා කරන්න. එසේ දැල්වේනම් ඔබට දින 7කට පසු කුණු දැම්ම ආරම්භ කලහැක.

**02 දෙවෙනි සතිය**

දිනකට කෑම කිලෝ 1ක් වතුර ලීටර 1ක් සමග මිශ්‍ර කර කෑම දමන පුනීලයෙන්/ බටයෙන් ඇතුලු කරන්න.

නිපදවෙන ජීව වායු ප්‍රමාණය ප්‍රමාණවත් නම් ලිප සඳහා භාවිතා කරන්න.

**03 තුන්වෙනි සතිය**

දිනකට කෑම කිලෝ 2ක් වතුර ලීටර 2ක් සමග මිශ්‍ර කර කෑම දමන පුනීලයෙන්/ බටයෙන් ඇතුලු කරන්න.

නිපදවෙන ජීව වායු ප්‍රමාණය ලිප සඳහා භාවිතා කරන්න.

- ඉන් පසු දිනපතා කෑම කිලෝ 3ක් (උපරිමය කිලෝ 3යි) ජලය ලීටර 06ක මිශ්‍ර කර පුනීලයෙන් ඇතුලත් කරන්න. ජීව වායුව දිනපතා භාවිතා කරන්න.
- ජීව වායු දියර පොහොර සාමාන්‍යයෙන් දිනකට ලීටර 05ත් 10ත් අතර ප්‍රමාණයක් ලබා ගත හැක.
  එම දියර පොහොර අවශ්‍ය පරිදි ජලය යොදා තනුක කර වගාව සඳහා යෙදිය හැක. (සාමාන්‍යයෙන් දියර ලීටර 1ට ජලය ලීටර 3)

**සැලකිය යුතුයි**

Eco Buddy ජීව වායු ජනකය සඳහා ආම්ලික ද්‍රව්‍යය ඇතුලු කිරීමෙන් වළකින්න. (දෙහි දෙඩම් තක්කාලි අන්නාසි ආදිය) මෙම ජීව වායු ජනකයේ ධාරිතාව කුඩා නිසා පොල්කුඩු, බිත්තර කටු, එළු පොතු ආදියද නොදමන්න.

**අවවාදයයි**

ජීව වායු ජනකයට පහසුවෙන් දිරන අපද්‍රව්‍ය පමනක් ඇතුලු කරන්න. ගල්, වැලි, පොල්කටු, පොල්මුඩු, බෙලිකටු, දිවුල්කටු, පොලිතීන්, ප්ලාස්ටික්, අගුරු, අළු හා මුළුතැන්ගෙයි අතුගා එකතුකරන කුණු ආදිය නොදමන්න.

**Eco Bbuddy ජීව වායු ජනකය මගින් ඔබට ලැබෙන වාසි**

- දිනපතා කාබනික දියර පොහොර ලීටර 05ත් 10ත් අතර ප්‍රමාණයක් ලබාගත හැකිවීම.
  මෙම කාබනික දියර පොහොර ඉතාමත් වටිනා වසවිස නැති පොහොර වර්ගයකි. මෙමගින් නිවසට අවශ්‍ය එළවළු පලතුරු හා පලා වර්ග මෙන්ම මල් ආදියද වගාකල හැක. එමෙන්ම කුඹුරු හා අනෙකුත් වාණිජ බෝග හා එළවළු වගා වලටද භාවිතා කලහැක.
  යොදාගන්නා කසළ වර්ගය හා කොළ වර්ගය අනුව දියර පොහොර වල තත්වය හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීම කලහැක
- වැඩිපුර එකතුවන දියර පොහොර තත්වයෙන් වැඩිදියුණු කර අලෙවි කිරීම තුලින් අමතර ආදායමක්ද ලබාගත හැක.
- දිනකට(තනිලිප ගැස් උදුනක් විනාඩි 45ක්) එක් ආහාර වේලක් පිළියෙල කරගැනීමට ප්‍රමාණවත් ගැස් ප්‍රමාණයක් ලබාගත හැකිවීම.
- නිවසේ දිරන කසළ හා ඉදුල් වතුර වැනි අප ජලය කළමණාකරණයට කදිම විසඳුමකි. නිවසේ ඇති දිරාපත් වන කැලි කසළ නිසියාකාරව යොදාගන්නා නිසා පරිසරය පිරිසිදුව හා අලන්කාරව තබාගතහැකි වීම.
- Eco Buddy ජීව වායු ජනකය පවුලේ සැමගේ සහභාගීත්වයෙන් පවත්වාගෙනයාම තුලින් දරුවන්ට **අධ්‍යාපන මෙවලමක්** මෙන්ම තරුණ පරපුරට නව අනාගත හරිත පාරිසරික අත්දැකීමක්ද ලබාගත හැකි කදිම **අනාගත ආයෝජනයකි.**

**මූලික නඩත්තුව හා භාවිතය**

Eco Buddy ජීව වායු ජනකය දිනපතා නිසියාකාරව පරිහරණය, නඩත්තුව හා පිරිසිදුව පවත්වාගෙන යායුතුය.

නල පද්ධතිය , වැල්ව ආදියෙහි ගැස් කාන්දුවීම් තිබේදැයි බලා ඒමතට සබන් දියර යොදා පරික්ෂා කර සකස්කර ගැනීම.

ජීව වායු ලිප මසකට වරක් සියලුම කොටස් පිරිසිදු කිරීම.

මැනෝමීටරයද දිනපතා පරික්ෂා කර බැලිය යුතුය.

මසකට වරක් ජලය ඉවත් කරන කරාමය විවෘතකර එකතු වී ඇති ජලය ඉවත් කරන්න.

දිනපතා නියමිත කසළ නියමිත ප්‍රමාණයට ඇතුලු කිරීම හා දිනපතා සෑදෙන ගැස් ප්‍රමාණය පාවිච්චි කිරීම තුලින් සාර්ථක ප්‍රතිපල ලබාගත හැක.

**ගැටළු නිරාකරනය කර ගැනීම**

Eco Buddy ජීව වායු ජනකය භාවිතයේදී ගිනි දැල්ල පත්තුවන්නේ නැතිනම්, දියර පොහොර කහපාට වී අධික දුර්ගන්ධයක් සහිත නම් ජීව වායු ජනකයේ මාධ්‍යයෙහි ආම්ලිකතාවය වැඩිවී ඇත . එවිට මුලින්ම කෑම දැමීම නවත්වන්න. ඉන්පසු අළුහුණු කිලෝ 5ක් 6ක් (මෙය වෙළදපලෙන් මිළදී ගත හැක) දියකර දියරය පමනක් ජීව වායු ජනකයේ කෑම දමන පුනීලයට වක්කරන්න. අළුහුණු ස්වල්පයක් දියර පොහොර බැරලයටද ඉසින්න. පසුව හැකිනම් අමු ගොම බාල්දි දෙකක් දියකර වැලි ඉවත්කර පුනීලයෙන් දමන්න. දින කිහිපයකට පසු ලිප හොදින් දැල්වේනම් කසළ දැමීම නැවත ආරම්භ කලහැක.

**Eco Buddy** තුලින් ඔබට අනාගතයට හරිත දැක්මක්.